සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 09 - ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව

නම/විභාග අංකය :- ...................................................... කාලය: පැය 02 යි.

**I කොටස**

- ප්‍රශ්න සියල්ලටම දී ඇති උපදෙස් අනුව පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 05 තෙක් ප්‍රකාශ වල හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා තිත් ඉරමත ලියන්න.

(01) පෘථිවියේ මුළු ගොඩබිම් ප්‍රමාණයෙන් 30% ක් පමණ අයත් වන්නේ ................................................ මහාද්වීපයටයි. (අප්‍රිකා / ආසියා / යුරෝපා)

(02) '' ලෝකයේ පියස්ස '' යන අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලබන්නේ .................................................. සානුවයි (පාමීර් / ඩෙකෑන් / ටිබෙට්)

(03) එක්සත් අරාබි එමීර් රාජ්‍ය, එමිරේට්ස් නමින් හඳුන්වන රාජ්‍ය ............................................. සමන්විත වේ. (7 / 6 / 8)

(04) ආසියාවේ ඉහළ ම උෂ්ණත්වයක් වර්තාවන ජකෝබාබාද් .......................................................... පිහිටි නගරයකි. (රුසියාවේ / පකිස්ථානයේ / ඉන්දියාවේ)

(05) පයින් වර්ග, ස්ප්‍රෘස්, ෆර්, ඕක් , ලාච් වැනි ශාක විශේෂ දක්නට ලැබෙන්නේ ......................................... වනාන්තර වලය. (නිවර්තන වර්ෂා / පතනශීලී / කේතුධර)

- **අංක 06 - 10 තෙක් දී ඇති ප්‍රකාශ වල හිස්තැනට සුදුසු වචන ලියා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

(06) යුරෝපය හා ආසියාව එක්ව සලකා එය ............................................ ලෙස හඳුන්වයි.

(07) කිසියම් රටක ජන සංඛ්‍යාවේ වයස අවුරුදු 15 න් ඉහළ පුද්ගලයන්ගේ අකුරු කියවීමට හා ලිවීමට ඇති හැකියාව .......................................................... ලෙස හඳුන්වයි.

(08) ජාත්‍යන්තර මට්ටමින් ඕසෝන් ස්තරය ආරක්ෂා කර ගැනීම අරමුණු කොටගෙන .................................................. සම්මුතිය ඇති කරගෙන තිබේ.

(09) 1 : 150000 භූ ලක්ෂණ සිතියම් වල භූ විෂමතා ලක්ෂණ .................................................... රේඛා වලින් දක්වා ඇත.

(10) ශ්‍රී ලංකාවේ භූ ලක්ෂණ දැක්වීම සඳහා 1 : 50000 ප්‍රමාණයේ සිතියම් ................................................ සකස් කර ඇත.

- **අංක 11 - 15 තෙක් ඇති ප්‍රකාශ නිවැරදි නම් ' නි ' යන්න වටා ද වැරදි නම් ' වැ ' යන්න වටා ද රවුමක් අඳින්න.**

(11) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව අසම ලෙස ව්‍යාප්ත වී ඇත. නි / වැ

(12) ඉන්දියාව ශ්‍රී ලංකාව මියන්මාර් යන රටවල නිවර්ත සැවානා දේශගුණය දක්නට ලැබේ. නි / වැ

(13) ජපානය ලෝකයේ පරමාණුක බලශක්තිය බහුලව භාවිත කරන රටකි. නි / වැ

(14) අම්පාර, වව්නියාව, ත්‍රිකුණාමලය නැගෙනහිර පලාතට අයත් වේ. නි / වැ

(15) කතරගම, මිහින්තලය, සීගිරිය ශේෂ කඳු ලෙස හඳුන්වයි. නි / වැ

- **ප්‍රශ්න අංක 16 - 20 තෙක් ප්‍රශ්න වල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(16) ආසියාවේ පිහිටා ඇති ලොව විශාලතම කඳු පන්තිය ලෙස සැලකෙන්නේ,

(1) යුරල් කඳු වැටියයි (2) හිමාලය කඳු වැටියයි

(3) අල්තායි කඳු වැටියයි (4) පිරනීස් කඳු වැටියයි

(17) ලොව ප්‍රධාන ගංගා නිම්න ශිෂ්ටාචාර අතුරෙන් ආසියා මහද්වීපයට අයක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) යුප්‍රටීස් ටයිග්‍රීස් නිම්න ශිෂ්ටාචාරය (2) හොවැංහෝ නිම්න ශිෂ්ටාචාරය

(3) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය (4) නයිල් නිම්න ශිෂ්ටාචාරය

(18) කැස්පියන් මුහුදට ගලා බසින ගංගාවකි.

(1) යුරල් (2) සර්ඩේරියා

(3) අමුඩේරියා (4) යෙනිසි

(19) ලොව අධිකතම ජන සංඛ්‍යාවක් වාසය කරන රට මින් කුමක්ද?

(1) ශ්‍රී ලංකාව (2) ජපානය

(3) චීනය (4) ඉන්දියාව

(20) ශ්‍රී ලංකාවේ වැඩිම වර්ෂාපතනය ලැබෙන මාලිබොඩ. වටවල කෙනිල්වර්ත් පිහිටා ඇති දේශගුණික කලාපය

(1) පහතරට තෙත් (2) කඳුකර වියලි


(3) කඳුකර තෙත් (4) අර්ධ ශුෂ්ක

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) (අ) පහත දැක්වෙන ආසියා මහද්වීපයේ සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න.




| | | | |
|---|---|---|---|
| (i) | හිමාලය කඳු | - | A, B, C |
| (ii) | හොවැංහෝ ගඟ | - | D, E, F |
| (iii) | ජපන් දූපත් | - | G, H, J |
| (iv) | අරාබි මුහුද | - | K, L, M |
| (v) | ගෝබි කාන්තාරය | - | N, O, P |

(ලකුණු 10)

(ආ) පහත සඳහන් දෑ 1 : 50000 හු ලක්ෂණ සිතියමෙහි භාවිත කරන සම්මත සලකුණු සංකේත හා වර්ණ භාවිත කරමින් ඇඳ දක්වන්න.

(i) පළාත් මායිම් (iii) පොල් වගාව

(ii) ප්‍රධාන මාර්ගය (iv) අඩිපාර (v) පාසල (ලකුණු 10)

(02) (i) ආසියා මහාද්වීපයටඋතුරින් පිහිටි සාගරය හා දකුණෙන් පිහිටි සාගරය නම් කරන්න. (ලකුණු 02)

(ii) ආසියා මහද්වීපයේ පිහිටා ඇති ප්‍රමාණයෙන් විශාල දූපත් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ආසියානු ප්‍රදේශය සුවිශේෂී වීමට හේතු තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(04) (i) යාබද ශ්‍රී ලංකා සිතියමේ 1, 2, 3 ලෙස දක්වා ඇති භූ විෂමතා කලාප තුනෙන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) මීටර් 300 වැඩි කලාපයේ දක්නට ලැබෙන භූ විෂමතා ලක්‍ෂණ තුනක් නිදසුන් සහිතව දක්වන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය ලැබෙන ක්‍රම තුන දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)




(05) (i) යාබද සිතියම් 1, 2, 3, 4 වශයෙන් දක්වා ඇති දේශගුණික කලාප හතර නම් කරන්න. (ලකුණු 02)

(ii) පහතරට තෙත් කලාපීය වනාන්තර පිලිබඳ පහත ශීර්ෂ යටතේ දක්වන්න

(a) ව්‍යාප්තව ඇති ප්‍රදේශ

(b) ප්‍රධාන ශාක

(c) වෘක්‍ෂලතා වල ලක්‍ෂණ (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ මාර්ග ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංවර්ධන සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)




(06) (i) '' සංවර්ධනය '' යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

(ii) සංවර්ධනය මැනීමට යොදා ගන්නා දර්ශක තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ වෙරළ බඩ කලාපයේ දක්නට ලැබෙන මානුෂ ක්‍රියාකාරකම් තුනක් සඳහන් කරන්න.

(b) ශ්‍රී ලංකාවේ මානුෂ ක්‍රියාකාරකම් භූ දර්ශනය කෙරෙහි ඇති කරන බලපෑම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 05)

(07) (i) පරිසර පද්ධතියේ දක්නට ලැබෙන

(a) ජීව සංරචක

(b) අජීවී සංරචක දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පරිසරයට අහිතකර මානුෂ ක්‍රියාකාරකම් තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) පාරිසරික තුලිත තාව ආරක්ෂා කිරීමට

(a) ජාතික මට්ටමින් ගෙන ඇති පියවර තුනක්

(b) ජාත්‍යන්තර මට්ටමින් ගෙන ඇති පියවර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 05)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 09 - ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | ආසියා | (06) | යුරේෂියා | (11) | නි | (16) | 2 |
| (02) | ටිබෙට් | (07) | සාක්ෂරතාව | (12) | වැ | (17) | 4 |
| (03) | 7 | (08) | මොන්ට්‍රියල් | (13) | නි | (18) | 2 |
| (04) | පකිස්ථානයේ | (09) | සමෝව | (14) | වැ | (19) | 3 |
| (05) | කේතුධර | (10) | 92 | (15) | නි | (20) | 3 |

### II පත්‍රය

(01) (අ) (i) C (ii) D
(iii) H (iv) K
(v) N

(ආ) නිවැරදි වර්ණ සංකේත භාවිත කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(02) (i) උතුරින්- ආක්ටික් සාගරය
දකුණින් - ඉන්දියන් සාගරය

(ii) ජපන් දූපත්, ඉන්දුනීසියානු දූපත්. පිලිපීන් දූපත්, ශ්‍රී ලංකාව, තායිවානය

(iii) - විශාලම මහාද්වීපය වීම
- සියළුම දේශගුණ වර්ග දක්නට ලැබීම
- මානව වර්ග, ජන වර්ග, භෂා හා සංස්කෘතික විවිධත්වය
- ප්‍රධාන ආගම් රැසක නිජබිම වීම
- ලෝකයේ විශාලතම කඳු පද්ධතිය සහ වඩාත් උසම කඳු ශිඛරය පිහිටා තිබීම
- වැඩිම ජන සංඛ්‍යාවක් වාසය කිරීම ආදී

(03) (i) මොනගොලොයිඩ් / කොකසොයිඩ්

(ii) <u>ජනාධික</u>
- දකුණු ආසියාව
- අග්නි දිග ආසියාව / නැගෙනහිර ආසියාව - මේවායේ රටවල් ලියා ඇතත් නිවැරදියි.

<u>ජනහීන</u>
- මධ්‍යම ආසියාව
- මොංගෝලියාව
- උතුරු දිග තැන්බිම්
- ගෝබි හා තාර් කාන්තාර ප්‍රදේශ

(iii) - ගුවන් ගමන් මධ්‍යස්ථානයක් වීම
- නිදහස් වෙළඳ වරාය ජෙබිල් අලි
- සංචාරක ආකර්ෂණ බව
- ජාත්‍යන්තර සන්නිවේදන සේවා මධ්‍යස්ථානයක් වීම
- ක්‍රිකට් හා ටෙනිස් ක්‍රීඩා සඳහා ක්‍රීඩාංගන පහසුකම් සපයන සේවා මධ්‍යස්ථානයක් වීම
- ලෝකයේ විශාලතම වෙළඳ මධ්‍යස්ථානය පිහිටුවා තිබීම Dubai mall

(04) (i) 1. වෙරළබඩ තැනිතලාව
2. අභ්‍යන්තර තැනිතලාව
3. මධ්‍යම කඳුකරය

(ii) කඳු - සමනල, නමුණුකුල, පිදුරුතලාගල, නකල්ස්, ආදී...............
සානු - මහනුවර, හැටන්, වැලිමඩ, මහවල තැන්න, කොස්ලන්ද ආදී.................
දිය ඇලි - බඹර කන්ද, දුන්හිඳ, ලක්ෂපාන, දියලුම, රම්බොඩ ආදී..............

(iii) සංවහන වර්ෂාව / මෝසම් වර්ෂාව / වාසුලි වර්ෂාව
තෝරා ගත් ඕනෑම වර්ෂාපතන ක්‍රමයක
- කාලවකවානු දක්වීම
- වර්ෂාව ලැබෙන ප්‍රදේශ
- විශේෂ ලක්ෂණ ඇතුලත් කොට ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(05) (i) 1. පහතරට තෙත් කලාපය
2. පහතරට වියළි කලාපය
3. කඳුකර තෙත් කලාපය
4. අර්ධ ශුෂ්ක කලාපය

(ii) පහතරට තෙත් කලාපය
- ශ්‍රී ලංකාවේ බටහිර හා නිරිත දිග ප්‍රදේශ
උදා : සිංහරාජය, කන්නෙලිය, දෙදියගල, නාකියාදෙනිය ආදී..................
- ප්‍රධාන ශාක
උදා : හොර, කීන, නා, ගොඩපර, මිල්ල, මීදෙල්ල ආදී...........

<u>වෘක්ෂලතා ලක්ෂණ</u>
- ගස් 30m - 40m තරම් උසය.
- වියන් ස්තර කිහිපයකි
- වනාන්තර අවුරුද්ද මුළුල්ලේ ම වැඩෙමින් පවතී.
- තද කොළ පැහැතිය
- ශාක ඝනත්වය වැඩිය.
- වනාන්තර තුළ අඳුරු ස්වභාවයක් පවතී.
- යටිරෝපණ බහුලය.
වැල් වර්ග, හා මීවන ලයිකන, උඩවැඩියා බහුලය.

(iii) - මාර්ග පුළුල් කිරීම
- ගුවන් පාලම් ඉදි කිරීම
- ග්‍රාමීය මාර්ග ඉදි කිරීම හා සංවර්ධනය
- අධිවේගී මාර්ග ඉදි කිරීම
කරුණු තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(06) (i) ආර්ථික, සමාජීය හා සංස්කෘතික යන අංශයන් ඇතුලත් කොට පිළිතුර ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ii) - ඒක ශීර්ෂ ආදායම
- ළදරු මරණ අනුපාතය
- උපතේදී ආයු අපේක්ෂාව
- සාක්ෂරතාව

(iii) (a) - ධීවර කර්මාන්තය
- කොහු කර්මාන්තය
- හුණුගල් කර්මාන්තය
- ලුණු කර්මාන්තය
- සංචාරක කර්මාන්තය

(b) - නායයාම්
- වායුගෝලීය දූෂණය
- වෙරළ ඛාදනය
- කුණු කසල ජලයට බැහැර කිරීම නිසා ඇතිවන ජල දූෂණය
- ගොඩබිම දූෂණය (කසල බැහැර කිරීම නිසා)

(07) (i) ජීවී - ශාක හා සත්ත්වයන්
අජීවී - සූර්ය ශක්තිය, වාතය, ජලය, පස, භූ රූප, පාෂාණ

(ii) - වනාන්තර විනාශ කිරීම
- කෘෂි රසායන භාවිතය
- පොසිල ඉන්ධන භාවිතය
- අක්‍රමවත් නාගරීකරණය
- කැලි කසල අවිධිමත් ලෙස බැහැර කිරීම
- යුධ අවි අත්හදා බැලීම

(iii) (a) <u>ජාතික සංවර්ධන සැලැස්ම යටතේ</u>
- ඉඩම් භාවිතය සැලසුම් කිරීම
- වන ජීවීන් හා වන සංරක්ෂණය
- වනාන්තර වලට, ජලයට හා පසට හානි නොවන ලෙස කෘෂිකර්මාන්තය සංවර්ධනය
- වෙරළ සංරක්ෂණය
- පරිසර අධ්‍යාපනික වැඩසටහන් මෙහෙය වීම
- මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවීම
- පරිසර අමාත්‍යංශය පිහිටුවීම

පනත් සම්මත කිරීම
- ජාතික උරුම වන භූමි පනත
- වෙරළ සංරක්ෂණ පනත

(b) • තෙත් බිම් සංරක්ෂණය පිලිබඳ රැම්සාර් සම්මුතිය
• ඕසෝන ස්තරය ආරක්ෂා කිරීමේ අරමුණු කොටසක් මොන්ට්‍රියල් සම්මුතිය